# මනෝවිද්‍යාත්මක උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (සති අන්ත ) පාඨමාලාව 2025/2026

## අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශය, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

(අදාළ පුවත්පත් නිවේදනය අනුව ඉල්ලුම්පත්‍රය සමග නිකුත් කරන ලද්දකි.)

***<u>පරමාර්ථය</u>***

ශ්‍රී ලංකාවේ උපදේශන ක්ෂේත්‍රයට පූර්ණ ලෙස දායක වියහැකි විද්වත් වෘත්තිකයන් බිහිකිරීම මෙම පාඨමාලාවේ පරමාර්ථයයි. උපදේශන මනෝවිද්‍යා ක්ෂේත්‍රයේ කාලීන වලංගුතාවයෙන් යුතු සිද්ධාන්තික පදනමක් මත ලබාදෙන වෘත්තීය කුසලතා පුහුණුව තුළින් මනෝවිද්‍යාත්මක, අධ්‍යාපනික, පවුල් හා වෘත්තීය උපදේශනය හා ප්‍රතිකාරක මැදිහත්වීම සඳහා පාඨමාලාලාභීන් මෙම පාඨමාලාව මගින් සූදානම් කරනු ලැබේ.

1992 වර්ෂයේ දී ආරම්භ කරන ලද මෙම පාඨමාලාව උපදේශනය පිළිබඳ මෙරට ආරම්භ වූ ප්‍රථම පාඨමාලාව මෙන්ම වඩාත් පිළිගන්නා වූ උසස්ම පාඨමාලාව වශයෙන් සැලකිය හැකිය. සිසුන් 24 දෙනෙකුගෙන් පමණ ආරම්භ කරන ලද පාඨමාලාවට දැනට වර්ෂයකට සිසුන් 100ක් පමණ බඳවා ගනු ලබයි. කම්කරු හා වෘත්තීය පුහුණු ඇතුළු අමාත්‍යාංශ කිහිපයකින්ම සිය දෙපාර්තමේන්තුවල උසස් තනතුරුවලට බඳවා ගැනීමේ හා උසස් කිරීම් සඳහා නිර්දිෂ්ට සුදුසුකමක් වශයෙන් ද මෙම පාඨමාලාව පිළිගනු ලබයි.

කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය හා ආචාර්යවරුන් සමග ක්ෂේත්‍රයේ පළපුරුදු ප්‍රවීන ආචාර්ය මණ්ඩලයක් විසින් මෙම පාඨමාලාවේ ඉගැන්වීම් හා පුහුණු කටයුතු මෙහෙයවනු ලැබේ. මහාචාර්යවරුන්, සායනික මනෝවිද්‍යාඥයින්, මනෝවිද්‍යා විශේෂඥයින්, මනෝවෛද්‍යවරු සහ පුහුණු උපදේශකවරුන්ගෙන් ද එම ආචාර්ය මණ්ඩලය සමන්විත වේ.

ශ්‍රී ලාංකික සමාජයට කාලීනව අවශ්‍ය වී ඇති මනෝසමාජයීය සහාය සේවා සැලසීම සඳහා වූ විශේෂිත පුහුණුවක් ද මෙම පාඨමාලාවෙන් ලබාදීමට නියමිතය. ස්වභාවික ව්‍යසන මෙන්ම විවිධ වූ ප්‍රභවයන් හේතුවෙන් පුද්ගලයින් තුළ ජනිත වන කාංසා, ආතති හා ක්ලමථ තත්ත්වයන්ට ඔරොත්තුදීම සඳහා බාල, තරුණ හා වැඩිහිටි සැමට සහාය වීමට හැකි වෘත්තිකයින් පාඨමාලාවෙන් බිහිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

***<u>අරමුණු</u>***

1. උපදේශන සේවා වෘත්තිකයකු සතුවිය යුතු

    1.1 දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය
    1.2 පෞරුෂ ගුණාංග සහ ආචාර ධර්ම ප්‍රගුණ කිරීම

2. විද්‍යාත්මක පදනමක් මත උපදේශන ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම

3. සේවාලාභීන්ට වලංගුතාවෙන් යුතු පුද්ගල, අධ්‍යාපනික, වෘත්තීය, පවුල් සහ විශේෂ අංශයන්හි උපදේශන සේවා ලබාදීම.

***<u>සුදුසුකම්</u>***

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ ආයතනයකින් උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම හෝ
2. පිළිගත් විශ්වවිද්‍යාලයකින් වෙනත් ඕනෑම උපාධියක් හා උපදේශනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවට අදාළ විෂය ක්ෂේත්‍රයකින් සේවා අත්දැකීම් හෝ සම්භාර 30ක ඉගෙනුම් අත්දැකීම් ලබා තිබීම හෝ
3. කොළඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව සහ අධ්‍යාපන පීඨයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන NVQ Level 7 සම්පූර්ණ කරන ලද පාඨමාලාවක් සහ (SLQF අනුව ප්‍රථම උපාධියකට සමාන) සේවා අත්දැකීම් සහිත අයකුවීම
4. පාඨමාලාව පැවැත්වෙන මාස 15ක කාලය තුළ සෙනසුරාදා සහ ඉරිදා දිනවල දී සහ පාසල්/රජයේ නිවාඩු දිනවල දී සේවයෙන් නිදහස් කරන බවට එකඟ වෙමින් සේවා ප්‍රධානියාගෙන් ලත් අවසර ලිපියක් ඉදිරිපත් කිරීම.
5. පෞද්ගලික දුක් කරදර අඩුබව හා මනා ක්‍රියාශීලී ප්‍රසන්න පෞරුෂ ගුණාංගවලින් යුතුවීම.

තෝරා ගැනීමේ දී පහත දැක්වෙන අයදුම්කරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් යොමු කරනු ලැබේ.

1. උපදේශන සේවා වෘත්තිකයකු ලෙස සේවය කිරීම/හෝ දැනටමත් පාසලක, කාර්මික විද්‍යාලයක, විද්‍යා පීඨයක උපදේශකවරයකු වශයෙන් පත් කරනු ලැබ තිබීම. (මේ බව සනාථ කරන ලිපි ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.)

2. උපදේශන සේවා විෂය ඉගැන්වීමේ නිරතව සිටින පුද්ගලයින්, සමාජ සේවකයන්, වෛද්‍යාමය/අර්ධ වෛද්‍යාමය වෘත්තීන්හි නියැලෙන පුද්ගලයින්, පුනරුත්ථාපන, හැඩගැස්වීමේ හෝ වෙනත් මානුෂීය සේවාවක නිරතව සිටින පුද්ගලයකු වීම

පාඨමාලාවේ අන්තර්ගතය

1 උපදේශන සේවා මූලිකාංග
2 සාමාන්‍ය මනෝවිද්‍යාව
3 සංවර්ධන මනෝවිද්‍යාව
4 අසාමාන්‍ය මනෝවිද්‍යාව
5 මනෝවිද්‍යාත්මක උපදේශන සේවා ක්‍රම ශිල්ප
6 උපදේශනයේ දී පරීක්ෂණ හා ඇගයුම්
7 උපදේශන කුසලතා හා ප්‍රායෝගික පුහුණුව
8 ව්‍යාපෘතිය/සුළු පර්යේෂණ නිබන්ධනය

***<u>ප්‍රායෝගික අත්දැකීම් හා පුහුණුව</u>***

ප්‍රායෝගික අත්දැකීම් සඳහා නියමිත වැඩ සටහනකට අනුව පුහුණු කටයුතු සිදුවේ.

***<u>පාඨමාලා ගාස්තු</u>***

පාඨමාලා ගාස්තුව රු.185,000කි. ගෙවන ලද පාඨමාලා ගාස්තු කිසිම හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු නොලැබේ.

පාඨමාලා ගාස්තුවට අනෙකුත් සියලුම වියදම් ඇතුළත් කර ඇති බැවින්, විභාග, විභාගවලට අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා වෙනත් වියදම්, ආදියට ගාස්තු අය කරනු නොලැබේ.

***<u>තෝරා ගැනීමේ ක්‍රමය</u>***

***<u>සම්මුඛ පරීක්ෂණ</u>***

උපදේශන සේවා වෘත්තියට අදාළ පෞරුෂමය ස්වභාවය හා ගති ලක්ෂණ, වෘත්තීයමය ගුණාංග සහ ඉංග්‍රීසි දැනුම කෙරේ සැලකිල්ලක් දක්වනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ පහත සඳහන් අවශ්‍යතා නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් පමණි.

1 ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසන් දිනය හෝ එදිනට පෙර නිසි ලෙස සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍ර කොළඹ විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබීම.
2 අයදුම් පත්‍රයේ සියලුම කොටස් නිසි ලෙස සම්පූර්ණ කොට තිබීම.
3 බඳවා ගැනීමේ දැන්වීමේ සඳහන් අවශ්‍යතා සියල්ල සපුරා තිබීම.

***<u>වෙනත් කරුණු</u>***

ඔබ දේශනවලින් 80% කට සහභාගි වුවහොත් පමණක් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. දේශන ආරම්භයේ සිට අවසානය දක්වා රැඳී සිටිය යුතුය. ප්‍රායෝගික පුහුණුවීම් සියල්ලටමත්, වෘත්තීය පුහුණුවටත් පැමිණීම වෙන වෙනම ලේඛනගත කෙරේ. මෙම පාඨමාලාව හුදෙක් සිද්ධාන්තමය ඉගෙනුමට සීමා වූවක් නොව ප්‍රතිකාරාත්මක ක්‍රම ශිල්ප ආශ්‍රිත කුසලතා පුහුණුව ද අරමුණු කරගත්තක් බව අයදුම්කරුවන් හොඳින් තේරුම් ගත යුතුවේ. පැමිණීම පිළිබඳ රෙගුලාසි තදින් ක්‍රියාත්මක කරනු ලබන්නේ මෙම කුසලතා නිසිලෙස හා ප්‍රමාණවත් පරිදි අපේක්ෂකයින්ට ලබාදීමේ යහපත් චේතනාවෙනි.

ප්‍රායෝගික පුහුණුව අදියර කිහිපයකින් සිදුවේ. පුහුණු උපදේශකවරයකු යටතේ ලබාගන්නා සායනික ප්‍රායෝගික අත්දැකීම් ලැබීම අනිවාර්ය වේ. අයදුම්කරුගේ පහසුව අනුව එබඳු ආයතනයකින් හෝ පුද්ගලයෙක් සමග පුහුණුවීම් කටයුතු පිළියෙල කරගැනීම අයදුම්කරුගේ වගකීම වේ.

උපදේශන කුසලතා පුහුණු සැසිවල දී බැහැර යාමට අවසර දෙනු ලබන්නේ තමන් අසනීපවීම, පවුලේ සාමාජිකයකු සම්බන්ධ බරපතල යම් ගැටලුවක් බඳු ඉතා සීමිත කරුණු සම්බන්ධයෙන් පමණි. අසනීප සම්බන්ධයෙන් ගන්නා සෑම නිවාඩුවක්ම වෛද්‍ය සහතිකයක් මගින් සනාථ කළයුතු අතර එම වෛද්‍ය සහතික කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි විසින් අනුමත කළ යුතුය. නිවාඩු ගන්නා කරුණු කොතරම් සාධාරණ වුවද ප්‍රායෝගික පුහුණුවලින් 80% කට වඩා සහභාගි නොවූ විට ඊළඟ වර්ෂයේ එම කොටස සම්පූර්ණ කරන තුරු විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

පාඨමාලාවට අයදුම් කළ යුත්තේ ඉහත සඳහන් තත්ත්වයන් යටතේ මාස 15ක් පමණ ඉගෙනීමේ කටයුතුවල නිරතවීමට ඉඩ ප්‍රස්තාව තිබේදැයි යථාර්තවාදීව සලකා බැලීමෙන් පසුව පමණි. ඉහත කී කොන්දේසි පිළිබඳව ඔබගේ සේවා යෝජකයා සමග සාකච්ඡා කොට එකඟතාවයකට පැමිණීම පාඨමාලාව ආරම්භ කිරීමෙන් පසු මතුවන ගැටලු වළක්වා ගැනීමට උදව් වනු ඇත.

සෑම විටම පාඨමාලාවේ කටයුතුවලට සහභාගී විය නොහැකිවීමේ හේතු ලිඛිතව පාඨමාලාවේ සමම්බන්ධීකාරක ආචාර්යවරයාට දැනුම් දිය යුතුවේ.

මෙම පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන්නන්ට උපදේශන සේවා වෘත්තියේ නිරතවීමට ඉඩ ප්‍රස්තා සැලසෙනු ඇත. අනාගතයේ රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද මේ ආශ්‍රිත රැකියා අවස්ථා බිහිවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය :** 2024 නොවැම්බර් 30

**අයදුම්පත් එවිය යුතු ලිපිනය :**

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි<br>
උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව<br>
අධ්‍යාපන පීඨය<br>
කොළඹ විශ්වවිද්‍යාලය<br>
කොළඹ 03

ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු.1500/-කි. ඕනෑම මහජන බැංකු ශාඛාවකින්, තිඹිරිගස්යාය මහජන බැංකුවේ 306061700005 ගිණුම් අංකයට රු.1500/- ක් ගෙවූ බැංකු වවුචරයේ පිටපතක් සහ ඔබේ ලිපිනය ලියූ රු.100ක මුද්දර ඇලවූ සෙ.මී.22x10 ප්‍රමාණයේ ලියුම් කවරයක් ඉල්ලුම්පත සමග අමුණා එවිය යුතුය.

වැඩිවිස්තර දැනගැනීමට අවශ්‍ය නම් අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශය, අධ්‍යාපන පීඨය විමසිය හැකිය. දුරකථන අංකය - 0112504734

පාඨමාලා සම්බන්ධීකාරක<br>
අධ්‍යාපන මනෝවිද්‍යා අධ්‍යයනාංශය<br>
අධ්‍යාපන පීඨය.